ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය : www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| **නිකුත් කළේ** | රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2019.04.08 |

## රජයේ සුරැකුම්පත්වල සිදු කරනු ලබන ගනුදෙනු පිළිබඳ තත්කාලීන දැනුම් දීම (කෙටි පණිවුඩ / විද්‍යුත් තැපෑල හරහා දැනුම්දීම් සේවාව)

සුරැකුම්පත් ආයෝජන සඳහා තවත් විශේෂාංගයක් හඳුන්වා දෙමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලංකාසෙක්‍යුු පද්ධතිය ඔස්සේ කෙටි පණිවුඩ හා විද්‍යුත් තැපෑල හරහා දැනුම්දීමේ සේවාවක් 2019 මාර්තු 25 දින සිට හඳුන්වා දෙන ලදී. මෙමගින් රජයේ සුරැකුම්පත් ආයෝජකයින්ගේ (ලංකාසෙක්‍යුු පද්ධතියෙහි ගනුදෙනුකරුවන්ගේ) දැනුම්වත්භාවය වැඩි දියුණු කිරීම අරමුණු කෙරෙයි.

මෙම කෙටි පණිවුඩ / විද්‍යුත් තැපෑල හරහා දැනුම්දීමේ සේවාව මගින් රජයේ සුරැකුම්පත්වල ආයෝජකයින් හට තම සුරැකුම්පත් ගිණුමේ සිදු කරන ලද සෑම නිර්ලේඛන සුරැකුම්පත් ගනුදෙනුවක් සඳහාම තත්කාලීන දැනුම් දීමක් සිදු කෙරෙයි. එනම්, ගනුදෙනුකරුවන්ගේ සුරැකුම්පත් ගිණුමේ හෙවත් CDS ගිණුමේ ගනුදෙනුවක් සිදු කෙරෙන අවස්ථාවේදීම ගනුදෙනුකරුවන්ට ඉහත මාධ්‍යයන් ඔස්සේ ඒ පිළිබඳ දැනුම් දීමක් (කෙටි පණිවුඩ “LankaSecure” වෙතින්ද, විද්‍යුත් තැපෑල “no-reply@cbsl.lk” වෙතින්ද) ලැබෙනු ඇත.

තත්කාලීන දැනුම්දීම් කෙටි පණිවුඩයක් ලෙස හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් ලෙස හෝ නොඑසේ නම් එම මාධ්‍යයන් දෙකෙන්ම ගනුදෙනුකරුගේ මනාපය මත ලබාගත හැකිය. ඒ අනුව, මෙම පහසුකම සක්‍රිය කර ගැනීම සඳහා අදාළ භාරකාර ආයතනයන් (බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ප්‍රාථමික අලෙවිකරුවන්) විසින් එක් එක් ගනුදෙනුකරුට යෝග්‍ය දැනුම්දීමේ මාධ්‍යය සහ එම සම්බන්ධතා පිළිබඳ විස්තර ලංකාසෙක්‍යු පද්ධතියෙහි සටහන් කල යුතු ය.

මෙම සේවාව සඳහා ලියාපදිංචිය තහවුරු කර ගැනීම සඳහා ගනුදෙනුකරුවන් පහත දැක්වෙන පරිදි සිය අභිමත දැනුම්දීමේ මාධ්‍යය සහ සම්බන්ධතා විස්තර ලිඛිතව අදාළ භාරකාර ආයතනය වෙත භාර දිය යුතු ය.

- වඩාත් කැමති මාධ්‍යය විද්‍යුත් තැපැල් පණිවුඩයක් නම් වලංගු විද්‍යුත් තැපැල් ලිපිනයක්,
- වඩාත් කැමති මාධ්‍යය කෙටි පණිවුඩයක් නම් වලංගු ජංගම දුරකථන අංකයක්, හෝ
- ඉහත මාධ්‍යයන් දෙකෙන්ම දැනුම්දීම ලැබීමට කැමති නම් විද්‍යුත් තැපැල් ලිපිනයක් සහ වලංගු ජංගම දුරකථන අංකයක් යන දෙකම

මෙම සේවාව මගින් ලබාදෙන දැනුම්දීම්වල අන්තර්ගතය, ගනුදෙනුකරුවන් විසින් භාරකාර ආයතනයන් වෙත ලබා දෙන ලද උපදෙස් සහ ගනුදෙනුකරුවන් සහ භාරකාර ආයතනයන් අතර වන ගිවිසුම්වලට අනුකූල බවට නිශ්චය කර ගැනීමට ගනුදෙනුකරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

මෙම කෙටි පණිවුඩ / විද්‍යුත් තැපෑල හරහා දැනුම්දීමේ සේවාව, ලංකාසෙක්‍යු පද්ධතිය විසින් දැනට ආයෝජකයින්ට ලබා දී ඇති සේවාවන් වන මුද්‍රිත ප්‍රකාශයන් මගින් සිදු කෙරෙන තහවුරු කිරීම් වලට සහ ගිණුම් ශේෂ හා ගනුදෙනු පිරික්සීමේ අන්තර්ජාල පහසුකම (Online Viewing Facility) ට අතිරේකව ලබාදෙන සේවාවකි.